# අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ ශිෂ්‍යයින්ගේ අර්ථාවබෝධ හැකියාව පිළිබඳ විචාරාත්මක අධ්‍යයනයක්

අධ්‍යාපන දර්ශනපති පශ්චාත් උපාධි පර්යේෂණ කෘතිය
1981 නොවැම්බර්

අධ්‍යාපන පීඨය, ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය
කොළඹ.

UCLIB
379992

[redacted]

**ඒ. එම්. එස්. අබේකෝන්**
බී. ඒ. (දෙවන පෙළ)
අධ්‍යාපන ඩිප්ලෝමා

## හැඳින්වීම.

කොළඹ ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ අධ්‍යාපන දර්ශනපති පශ්චාත් උපාධිය සඳහා ඉදිරිපත් කරනු ලබන මෙම පර්යේෂණ කෘතිය අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ සිසුන්ගේ අර්ථාවබෝධය, හැකියාව, සම්බන්ධයෙන් කරන ලද අධ්‍යයනයකින් ලබා ගත් තොරතුරු විශ්ලේෂණය කරමින් පිළියෙල වූවකි. පර්යේෂණ කාර්යයේ ප්‍රස්තුතය වූයේ අධ්‍යාපන පීඨයේ පර්යේෂණ හා උසස් උපාධි කමිටුව විසින් නිර්දේශ කරන ලද

"අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ ශිෂ්‍යයින්ගේ අර්ථාවබෝධ හැකියාව පිළිබඳ විචාරාත්මක අධ්‍යයනයක්" යන්නයි.

මෙම මාතෘකාව යටතේ පර්යේෂණ ක්‍රියාවලිය සඳහා අප විෂය ක්ෂෙත්‍රය කොට ගනු ලැබුයේ අ.පො.ස. සා. පෙළ විෂයමාලාවේ මවුබස (සිංහල) විෂයයේ "අර්ථාවබෝධය" සංකල්පයයි. මෙය ඉතා පෘථුල සංසිද්ධියකි. THE LARGE TYPE CONCISE ENGLISH DICTIONARY නමැති සංක්ෂිප්ත ශබ්ද කෝෂය මෙම වචනය අර්ථ කථනය කරන්නේ " තේරුම් ගැනීමට ඇති හැකියාවේ මානසික ධාරිතාව" යනුවෙනි. COMPREHENSION යන ඉංග්‍රීසි වචනය අවබෝධය යන පොදු පුළුල් අර්ථය සඳහා යෙදෙන අතර (VERBEL COMPREHENSION ) වාචික අවබෝධය,( READING COMPREHENSION ) කියවීමෙන් අවබෝධය, යනාදි වශයෙන් එහි විවිධ විකල්පයන් වෙන් කර කථා කරන බව පෙනේ. කෙසේ වුවද මෙම සංකල්පය භාෂාව හා සම්බන්ධ පෘථුල මානසික ක්‍රියාවලියක් බව පැහැදිලිය.

වචනවලින් ගම්‍යවන නොයෙකුත් අර්ථයන් ඇත. ඒවා යොදා ඇති භාෂා පරිසරය අනුව අර්ථය අවබෝධ කර ගැනීමයි අර්ථාවබෝධ ක්‍රියාවලියෙන් කෙරෙන්නේ. එනම් භාෂාව හා සංකල්ප අතර අන්‍යොන්‍ය සම්බන්ධතාව ගොඩ නැඟීමයි.

මෙහි "අර්ථ" ශබ්දය විවිධාර්ථවත්ය. ධර්ම ප්‍රදීපිකාවේ දැක්වෙන අන්දමට අභිධෙයයෙහි ලා ගැණෙන අර්ථ ශබ්දය මෙහිලා ගැනේ.

හැකියාව යන උප පදය සමඟ අර්ථාවබෝධය විකල්පය ගැලපීමට අප අදහස් කළේ 'වාගාර්ථාවබෝධය හැකියා විශේෂයක් වශයෙන් බුද්ධිය හා සම්බන්ධ කොට මනෝවිද්‍යාඥයින් කථා කරන බැවිනි. පර්යේෂණයේ ප්‍රධානතම අරමුණ වූයේ අර්ථාවබෝධ හැකියාව පොදු විභාග මට්ටමක සිටින සිසුන් පිරිසක් ඇසුරින් ලබා ගත් දත්ත අනුසාරයෙන් විශ්ලේෂණය කිරීමයි. අ.පො.ස.සාමාන්‍ය පෙළ සිසුන් සම්බන්ධයෙන් මෙම අධ්‍යයනය කිරීමේ එක් වැදගත් හේතුවක් නම් එම විභාගයේ සිංහල 1, 11 යන ප්‍රශ්න පත්‍රවල අර්ථාවබෝධය සම්බන්ධ ප්‍රශ්න ගණනාවක්ම අඩංගුවී තිබීමයි. විද්‍යාව, සමාජ අධ්‍යයනය ආදි සෙසු විෂය මඟින් ලබා ගන්නා සංකල්ප අර්ථවත් කර ගැනීමෙහි ලා ද මෙකී හැකියාව අතිශයින් පිටිවහල් වන බවට වාදයක් නැත. අද භාෂාව ගැන ඉගෙන ගන්නවාටත් වඩා භාෂාව වහල් කොට ගෙන කරන ඉගෙනුම කෙරෙහි දැඩි අවධානයක් යොමු කළ යුතුව ඇතැයි සිතන විට අර්ථාවබෝධයේ ඇති වැදගත්කම වඩාත් කැපී පෙනේ. මේ කාරණය මවුබස උගන්වන ගුරුවරයාට නැවත නැවතත් හුවා දැක්විය යුතු නැත. පෙළ පොතේ සෑම පාඩමක් පාසාම අර්ථාවබෝධය ( අවබෝධය ) අවධාරණය කර ඇති නිසා මේ විෂය ක්ෂේත්‍රය ගැන කරුණු පරීක්ෂා කිරීම පන්ති කාමර ඉගැන්වීම කෙරෙහි බෙහෙවින් ප්‍රයෝජනවත් වනු ඇත.

" අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ ශිෂ්‍යයින්ගේ අර්ථාවබෝධ හැකියාව පිළිබඳ විචාරාත්මක අධ්‍යයයයක් " යනුවෙන් පර්යේෂණ මාතෘකාව නිගමනය කිරීමේදී අප ගොඩ නඟා ගත් අභ්‍යුපන්‍යාසය වූයේ " සා.පෙළ සිසුන්ගේ අර්ථාවබෝධ හැකියාව දුර්වලය." යන්නයි. අවසාන පරීක්ෂණය පිළියෙල කරන විටද එම උප කල්පිතයෙහි තදින් එල්බ ගෙන පර්යේෂණ ක්‍රියාවලිය මෙහෙයවූ බව කිව යුතුය.

මෙම කෘතිය පරිච්ඡේද හයකින් සමන්විත වේ. පළමුවෙනි පරිච්ඡේදයෙන් සා.පෙළ විභාග ඉතිහාසය, අධ්‍යාපන අරමුණු සහ විෂයමාලාව පිළිබඳ සැකෙවින් කරුණු ඉදිරිපත් කෙරේ. දෙවෙනි පරිච්ඡේදයෙන් සා.පෙළ ශිෂ්‍යයාගේ වයස් ප්‍රතිමානයන් ,ඔවුන්ගේ කායික හා මානසික ලක්ෂණ , පිළිබඳ මනෝවිද්‍යාත්මක අර්ථ කථනයක්ද අ.පො.ස. නව විෂයමාලාව හා එහි සිංහල විෂය සම්බන්ධයෙන් කරුණුද සාකච්ඡා වෙයි. භාෂාව හා එය පුද්ගලයා තුළ වර්ධනය වන අන්දම පිළිබඳ ශාස්ත්‍රීය

විමර්ශනයක්ද මවුබස පිළිබඳ පාඨශාලා වැඩමාලාව, එහි විෂය නිර්දේශ හා ඉගැන්වීමේ කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම වෙනුවෙන් කර ඇති සේවාස්ථ ගුරු පුහුණු ආදි නවීකරණයන්ද විභාග වන්නේ තුන්වෙනි පරිච්ඡේදයෙනි. හතරවෙනි පරිච්ඡේදයේදී අවබෝධය විකල්පය පිළිබඳ විවිධ දෘෂ්ටිකෝණ වලින් කර ඇති අවලෝකනය අධ්‍යාපන ක්ෂේත්‍රයේ කවර කෙනෙකුට වුවද ප්‍රයෝජනවත් වේය යනු අපගේ විශ්වාසයයි. අවබෝධය මැනීමේ ශිල්පීක්‍රම සම්බන්ධයෙන් පස්වෙනි පරිච්ඡේදයෙන් සාකච්ඡා කෙරෙන කරුණු විශේෂයෙන් ඉගනුම් හා ඉගැන්වීම් කාර්යෙහිලා මඟ පෙන්වීමක් වනු ඇත. පර්යේෂණය සඳහා යොදා ගත් අවබෝධය ප්‍රශ්නාවලිය, බාහිර සාධක පිළිබඳ ප්‍රශ්නාවලිය හා අවබෝධය ඉගැන්වීමේ ක්‍රියාවලිය පිළිබඳ ගුරු වාර්තාව යනුවෙන් දත්ත රැස් කිරීමේ ශිල්පීක්‍රම අනුසාරයෙන් ලබා ගත් තොරතුරු විචාරාත්මක ලෙසත් සංඛ්‍යා විද්‍යානුකූලවත් විග්‍රහ කිරීම සඳහා හයවෙනි පරිච්ඡේදය මිඩංගු කර ඇත. ඉන් අනතුරුව එන උප ග්‍රන්ථාවලියෙන් දැක්වෙන්නේ තත් පර්යේෂණය සඳහා යොදා ගත් ප්‍රශ්නාවලින් සහ සංඛ්‍යානමය විස්තරාර්ථයන්ය.

මෙම අධ්‍යයනය සඳහා යොදා ගෙන ඇත්තේ සිංහල විෂය යටතේ පාසලේ ව්‍යවහාර වන සජීවී ප්‍රස්තුතයකි. එය නිරන්තර ගවේෂණවලට ලක්විය යුතු විචල්‍යයකි. කවර භාෂාමය පරීක්ෂණයකදී වුවද මෙම විෂය ක්ෂේත්‍රය යොදා ගන්නා බැවින් මෙහි වැදගත්කම වඩාත් කැපී පෙනේ. එසේම විෂය ක්ෂේත්‍රයේ පුළුල් බවත්, කලින් කල දැනීම් ලෝකයේ ඇතිවන උච්චාවචනයන් අනුව මෙම විචල්‍යයද වෙනස් මුහුණුවර ගැනීමට ඇති ඉඩ කඩත් නිසා එහි සීමාවන් කිසිවකුටත් නිශ්චය කළ නොහේ. වර්තමාන පාසල් විෂයමාලාව හා එහි අඩංගු අර්ථාවබෝධය විෂය ක්ෂේත්‍රය යටතේ එය ඉගැන්වීමේ හා ඉගෙනීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් පවතින සමකාලීන තත්ත්වය අවබෝධ කර ගැනීමෙහි ලා මෙම අධ්‍යයනයෙන් ඉදිරිපත් කරන නිගමන ප්‍රයෝජනවත් වනු ඇත යනු අපගේ විශ්වාසයයි.

ඒ. එම්. එස්. අබේකෝන්.

අධ්‍යාපන පීඨය,

ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය,

කොළඹ.